# 2017 මැයි 27 දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේදී සංශෝධනය කරන ලද ජපානයේ ශ්‍රී ලංකා සංගමයේ ව්‍යවස්ථාව.

ජපානයේ ශ්‍රී ලංකා සංගමයේ ව්‍යවස්ථාව (2017 මැයි 27 දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී සංශෝධනය කල පරිදි)

## I සංගමය

**1 ව්‍යවස්ථාව :**

a) නාමය : සංගමය, ජපානයේ ශ්‍රී ලංකා සංගමය නමින් නම් කළ යුතුය.

b) ලිපිනය : 108-0074 ටෝකියෝ, මිනා - ටෝකු ටකනාවා, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2-1-54, 401 යන ස්ථානයේ සංගමයේ කාර්යාලය පිහිටුවා ඇත.

c) ඊ මේල් : contact@slaj.jp

d) දුරකථනය : 0081 - 3 - 3440 - 6911

e) ෆැක්ස් මේල් : 0081 - 3 - 3440 - 6914

d) වෙබ් අඩවිය : http://slaj.jp

**2. ව්‍යවස්ථාව** - සංගමයේ පරමාර්ථ.

***සංගමයේ පරමාර්ථ පහත සඳහන් ඒවා විය යුතුය.***

a) ජපානයේ ශ්‍රී ලංකා ප්‍රජාව ශක්තිමත් කිරීම.

b) ශ්‍රී ලංකාව හා ජපානය අතර සමාජීය හා සංස්කෘතික සම්බන්ධතා වර්ධනය කිරීම සහ ;

c) ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.

**3. ව්‍යවස්ථාව** - ස්වභාවය

සංගමයේ ස්වභාවය වනුයේ

a) දේශපාලනයෙන් තොර වීම,

b) ලාභ නොලැබීම හා,

c) අපහාසයෙන් තොර වීම.

## II සාමාජිකත්වය

**4. ව්‍යවස්ථාව** : සුදුසුකම් - විධායක කමිටුව මගින් ශ්‍රී ලාංකිකයන් ලෙස හඳුනාගන්නා සියළුම දෙනා.

**5. ව්‍යවස්ථාව** : ඡන්ද බලය හිමි සාමාජිකයන්

a) සාමාන්‍ය සාමාජිකයන් - ජපානයේ එක් අවුරුද්දකට නො අඩු කාලයක් පදිංචි හෝ පදිංචි වීමට බලාපොරොත්තු වන වැඩිහිටියෝ සාමාන්‍ය සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබති. පවත්නා වසර දක්වා සම්පූර්ණයෙන් සාමාජික මුදල් ගෙවා ඇති සාමාජිකයින්ට ඡන්දබලය හිමි විය යුතුය.

b) ඡන්ද බලය හිමි සෑම සාමාන්‍ය සාමාජිකයෙකුගේම ඔහු විසින් නම් කරන ලද කලත්‍රයාට ඔහුගේ හෝ ඇයගේ ජාතිය කුමක් වුවත් නොමිලේ සාමාජිකත්වය ලැබිය යුතුය. සංගමයේ කාර්යයන්ට සෘජුවම සහයෝගය දක්වන ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවකයින්ට, විධායක කමිටුවේ අභිමතය පරිදි සාමාන්‍ය සාමාජිකත්වය ලබා දිය හැක.

c) සංයුක්ත සාමාජිකයින් - ජපානයේ ලියාපදිංචි වී ඇති සංයුක්ත පුරවැසියන්ට හෝ සංගම් වලට සංයුක්ත සාමාජිකත්වය හිමි විය යුතුය. පවත්නා වසර දක්වා සම්පූර්ණ සාමාජික මුදල් ගෙවා ඇති සංයුක්ත සාමාජිකයන්ට ඡන්ද බලය හිමි විය යුතුය. සංගමයේ සියළුම කාර්යයන් සඳහා සංයුක්ත සාමාජිකයන්ට තමන්ගේ නියෝජිතයින් ලෙස කටයුතු කිරීමට දෙදෙනෙකු නම් කළ හැකිය.

d) යාවජීව සාමාජිකයින් - සාමාන්‍ය සාමාජිකත්වයට සුදුසුකම් ලද ඕනෑම පුද්ගලයෙකුට යෙන් 100,000/- ක් ගෙවීමෙන් හෝ සංයුක්ත සාමාජිකයෙකුට යෙන් 100,000/- ගෙවීමෙන් යාවජීව සාමාජිකත්වයට හිමිකම් ලැබිය හැකිය. යාවජීව සාමාජිකයින් විසින් වාර්ෂිකව සාමාජික ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.

**ව්‍යවස්ථාවේ ඡන්ද බලය රහිත සාමාජිකයින්**

a) සහායක සාමාජිකයින් - එක් අවුරුද්දකට අඩු කාලයක් ජපානයේ පදිංචිව සිටින හෝ සිටීමට බලාපොරොත්තු වන වැඩිහිටියො සාමාන්‍ය සාමාජිකයින් විසින් නම් කලොත් සහයක සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබති. ජපානයේ පදිංචි කාල සීමාව නිම වීමෙන් පසු ඔවුනගේ සාමාජිකත්වය ඉබේම අහෝසි වී යනු ඇත.

b) කණිෂ්ට සාමාජිකයින් - වයස අවු 18ට අඩු හා අවු 12ට වැඩි සාමාන්‍ය සාමාජිකත්වය හිමි සාමාජිකයන්ගේ දරුවො සාමාන්‍ය සාමාජිකයෙකු විසින් නම් කරනු ලබන්නේ නම් කණිෂ්ට සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබති. ඔවුහු වයස අවු 18 ඉක්මවීමෙන් පසු ඔවුනගේ සාමාජිකත්වය ඉබේම අහෝසි වී යනු ඇත.

c) ආගන්තුක සාමාජිකයින් - පදිංචියක් නොමැති ආගන්තුක පුද්ගලයෝ සාමාන්‍ය සාමාජිකයෙකු විසින් නම් කිරීමෙන් ආගන්තුක සාමාජිකත්වයට හිමිකම් ලබති.

d) ගරු සාමාජිකයින් - විශේෂත්වයෙන් සැලකීමට වටිනා ඕනෑම පුද්ගලයෙකුට විධායක කමිටුවේ නියත අභිමතය පරිදි ගරු සාමාජිකත්වය ලබා දිය හැකිය. එසේ වුවත්, ඔවුන් නොකඩවා අවුරුදු දෙකක් රැස්වීම් වලට නොපැමිණියහොත් ඔවුන්ගේ සාමාජිකත්වය ඉබේම අහෝසි වී යනු ඇත.

## 7 ව්‍යවස්ථාව

සාමාජිකත්වය අනුමත කිරීම

සංගමයේ යහපත වෙනුවෙන් තම නිත්‍ය අභිමතය පරිදි කිසිඳු අගතියක් නොවන ලෙස ඕනෑම සාමාජික ඉල්ලුම්පතක් අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට විධායක කමිටුවට පුළුවන. කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කළහොත් ඊට හේතු දැක්විය යුතු නැත.

8 ව්‍යවස්ථාව

සාමාජිකයින්ගේ හැසිරීම - සංගමයේ ගෞරවය, හා ස්වභාවය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට සියළුම සාමාජිකයින් වග බලා ගත යුතුය.

9 ව්‍යවස්ථාව

සංගමයට ඇතුලත් වීම සඳහා ඇතුලත් වීමේ ගාස්තුවක් නොමැත.

10 ව්‍යවස්ථාව -වාර්ෂික සාමාජික ගාස්තු

a) සෑම සාමාන්‍ය සාමාජිකයෙකුම හා සංයුක්ත සාමාජිකයෙකු විසින්ම සාමාජික මුදලින් පිළිවෙලින් යෙන් 6,000/- ක් හා යෙන් 12,000/- ක් වශයෙන් අවුරුද්දක් හෝ ඉන් කොටසක් සඳහා හිඟ මුදලකින් තොරව ගෙවිය යුතුය. සාමාන්‍ය සාමාජිකත්වය ලබන්නට සුදුසුකම් ඇති අධ්‍යාපනය ලබන අයගේ සාමාජික ගාස්තුව වසරකට සාමාජික ගාස්තු ලෙස ජපාන යෙන් 1000/- ක් ගෙවිය යුතුය. ව්‍යාපාර සඳහා යෙන් 30,000/- ක් මුදලක් ගෙවිය යුතු අතර ඔවුනට විශේෂ වරප්‍රසාද ලබා දිය යුතුය. හිඟයක් නොමැතිව සියළුම සාමාජික මුදල් ගෙවා ඇති සාමාන්‍ය සාමාජිකයින්ගේ කලත්‍රයන්ට නොමිලේ සාමාන්‍ය සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබති. අවු 18 ට වඩා වැඩි සාමාන්‍ය සාමාජිකයින්ගේ දරුවන්ට සාමාන්‍ය සාමාජිකයින්ගේ ගාස්තුවෙන් එක් භාගයක් පමණක් ගෙවීමෙන් සාමාන්‍ය සාමාජිකයෙකු ලෙස ඇතුලත් වීමට පුළුවන.

b) යාවජීව සාමාජිකයින් සදහටම වාර්ෂික සාමාජික ගාස්තු ගෙවිය යුතු නොවේ. දැනටමත් වාර්ෂික සාමාජික මුදල් සම්පූර්ණයෙන් ගෙවා ඇති සාමාජිකයින් ඔවුන් විසින් යාවජීව සාමාජිකත්වයේ ගාස්තුව ඇති වෙනසකට අදාල මුදල ගෙවන්නේ නම් එම මුදල් වර්ෂය තුලදීම ඔවුන්ට යාවජීව සාමාජිකත්වය ලබාගත හැකිය.

11 ව්‍යවස්ථාව - වාර්ෂික සාමාජික ගාස්තු (අනෙක් සාමාජිකයන්)

| | | | |
|---|---|---|---|
| a) | සහායක සාමාජිකයින් | - | යෙන් 1,000/- |
| b) | කණිෂ්ට සාමාජිකයින් | - | ගාස්තුවෙන් නිදහස් |
| c) | ආගන්තුක සාමාජිකයින් | - | යෙන් 1,000/- |
| d) | ගරු සාමාජිකයින් | - | ගාස්තුවෙන් නිදහස් |

12 ව්‍යවස්ථාව

සංගමයේ මූල්‍ය වර්ෂය වනුයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වූ දින සිට මීළඟ වාර්ෂික මහා සභා රැස්වීම දක්වා වූ කාලයයි.

13 ව්‍යවස්ථාව

ගෙවන ලද ඇතුලත් වීමේ ගාස්තු හෝ සාමාජික ගාස්තු හෝ ඒවායින් කොටසක් හෝ මොනම හේතුවක් නිසාවත් කිසිම කෙනෙකුට ආපසු නොගෙවිය යුතුය.

14 ව්‍යවස්ථාව

කිසිම සාමාජිකයෙකු සාමාජික මුදල් තුන් මසකට අධික කාලයක් හිඟව තැබුවොහොත් ඒවා සම්පූර්ණයෙන්ම ගෙවා පියවන තුරු ඔහුට / ඇයට සංගමයේ වරප්‍රසාද කිසිවක් හිමි නොවනු ඇත. තව දුරටත් තවත් මාස 9ක් තුල හිඟ මුදල් ගෙවීමට ඔහු / ඇය අපොහොසත් වුවහොත් ඔහුගේ / ඇයගේ සාමාජිකත්වය අත්හිටවනු ලැබේ. එලෙස කිසියම් සාමාජිකයෙකුට ඔහුගේ / ඇයගේ සාමාජිකත්වය අහිමි වුවහොත් ඔහුගේ / ඇයගේ කලත්‍රයාගේ සාමාජිකත්වය ද ඉබේම අහෝසි වී යනු ඇත.

<u>15 ව්‍යවස්ථාව</u> - සාමාජිකයෙක් ඉල්ලා අස් වීම

සංගමයේ ලේකම්ට අදාල දිනට එක් මසකට කලින් ලිඛිතව හෝ ඊ-මේල් මගින් දැනුම් දීමෙන් පසු ඕනෑම සාමාජිකයෙකුට සංගමයෙන් ඉල්ලා අස් වීමට පුළුවන. ඔහුට / ඇයට එසේ කල හැක්කේ සංගමයේ සියළුම ලියකියවිලි වත්කම් හා දේපල සංගමයේ ලේකම්ට බාර දී ඇත්නම් පමණි.

<u>16 ව්‍යවස්ථාව</u> - සාමාජිකත්වය අහිමි වීම.

a) කිසියම් සාමාජිකයෙකුගේ හැසිරීම, සංගමයේ ස්වභාවයට හෝ පැවැත්මට අහිතකර නම්, ඔහුගේ / ඇයගේ සාමාජිකත්වය අහිමි කිරීමට සලකා බැලීම විධායක කමිටුව විසින් කළ යුතුය. එසේ වුවද කරුණු ඉදිරිපත් කිරීමක් සමඟ එම තීරණය නැවත සලකා බලන ලෙස විධායක කමිටුවට අභියාචනයක් ඉදිරිපත් කිරීමට සාමාජිකයාට පුළුවන.

b) කිසියම් සාමාජිකයෙකු විසින් නොකඩවා අවුරුදු දෙකක් සාමාජික මුදල් ගෙවා නැත්නම් ඔහුගේ සාමාජිකත්වය ඉබේම අහෝසි වී යනු ඇත.

c) තම සුදුසුකම් අවසන් වීමෙන් පසුව ඡන්ද හිමිකම් නොමැති සාමාජිකයන්ගේ සාමාජිකත්වය ඉබේම අහෝසි වී යනු ඇත.

<u>17 ව්‍යවස්ථාව</u> - සාමාජිකත්වය නැවත අළුත් කිරීම.

a) ඉහත <u>16 ව්‍යවස්ථාව</u> අනුව කිසියම් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහිමි වී ඇතොත් ඔහු හෝ ඇය සාමාජිකත්වය දරණ ලද කාල සීමාව සඳහා වැය කරන ලද හිඟ මුදල් ගෙවන තුරු නැවත සාමාජිකත්වය ලබා ගැනීමට ඉල්ලීමක් කළ නොහැකිය. එසේද කළ හැක්කේ එසේ හිඟ මුදල් ගෙවීම පැහැර හැරීම පිළිබඳ විධායක මණ්ඩලයට පිළිගත හැකි හේතු දැන්වූහොත් පමණකි.

## III මහා සභා රැස්වීම

<u>18 ව්‍යවස්ථාව</u> මහා සභා රැස්වීමේ පිළිවෙල

සංගමයේ මහා සභා රැස්වීම මෙලෙස විය යුතුය.

a) වාර්ෂික මහා සභා රැස්වීම හෝ
b) විශේෂ මහා සභා රැස්වීම

සෑම මහා සභා රැස්වීමකටම අඩුම තරමින් දින හතකටවත් කලින් සියළුම සාමාජිකයින්ට දිනය, වෙලාව, ස්ථානය හා න්‍යාය පත්‍රයද සමඟ දැනුම් දීමක් කළ යුතුය.

## IV වාර්ෂික මහා සභා රැස්වීම

අවුරුද්දේ මාර්තු මාසයේදී වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු අතර පහත සඳහන් අංග ඊට ඇතුලත් විය යුතුය.

a) නිලධාරී මණ්ඩලයද සමඟ විධායක මණ්ඩලය තෝරා ගැනීම.
b) ගරු සභාපතිගේ / ලේකම් ගේ වාර්ෂික වාර්තාව සලකා බැලීම.
c) කලින් වසර සඳහා විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සලකා බැලීම.

d) පෙබරවාරි මාසයේ විධායක කමිටු රැස්වීමට අඩුම තරමින් දින 10 කට වත් කලින් ඉදිරිපත් කර ඇති යෝජනා ආදිය වෙතොත් එම යෝජනාවේ කරුණු සහිතව දැන්වීමක් සමඟම යෝජනා මොනවා ද යන්න එවැනි සියළුම යෝජනා විධායක කමිටුව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. විධායක කමිටුව විසින් සලකා බලා අනුමත කර නැතොත් ඒවා මහා සභාවක දී ඉදිරිපත් නොකළ යුතුය.

## V විශේෂ මහා සභා රැස්වීම

a) පහත සඳහන් කරුණු සඳහා මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය.

දැනුම් දීමට හෝ සාකච්ඡා කිරීමට හෝ අදහස් විමසීමක් සඳහා වහාම යමක් කිරීම අවශ්‍යයි නම් ගරු සභාපතිගේ හෝ ලේකම් ගේ අදහස් වූ විට හා ඒ සඳහා මහා සභා රැස්වීමක් කැඳවිය යුතු යැයි පහදන විට,

b) සංගමයේ මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු යැයි විධායක කමිටුව යෝජනා කළ විට,

c) ඉදිරිපත් කොට ඇති ඉල්ලීම් පහත සඳහන් ව්‍යාපාර කාර්යයක් ක්‍රියාත්මක කිරීම සඳහා සාමාන්‍ය සංයුක්ත හෝ යාව ජීව සාමාජිකයන් ද විධායක නිලධාරීන් ඇතුළු එකොළොස් දෙනෙකුට හෝ ඊට අයිති පිරිසක් ලේකම් වෙත ලිඛිත ඉල්ලීමක් කළ විට එම රැස්වීම කළ යුත්තේ එම ලිඛිත ඉල්ලීම ලද දින සිට දින 21 ක කාලයක් තුළදී ය. ඉල්ලීම ලැබී දින දහයක් තුළ රැස්වීම පිළිබඳ දැන්වීම ද කළ යුතුය.

<u>19 ව්‍යවස්ථාව</u> - මහා සභා රැස්වීමක් සඳහා ගණපූර්ණය

මුළු සාමාජික සංඛ්‍යාවෙන් පහෙන් එකක් හෝ සාමාජිකයින් 15 ක් යන දෙකින් අඩු සංඛ්‍යාවක් විය යුතුය. මෙම රැස්වීම සඳහා සභාපති හෝ උප සභාපති, ලේකම් හෝ උප ලේකම් හා භාණ්ඩාගාරික හෝ උප භාණ්ඩාගාරික ඇතුළත් විය යුතුය.

## VI විධායක කමිටුව

<u>**20 ව්‍යවස්ථාව**</u>

ජපානයේ ගරු ශ්‍රී ලංකා තානාපතිතුමා අනුශාසකත්වය දැරිය යුතුය. ඊට අමතරව ජපානයේ පදිංචි ශ්‍රී ලාංකික ආගමික නායකයින් සියළු දෙනා සහ සාමජික නායකයින් සිව් දෙනෙකු ගරු අනුශාසකවරුන් ලෙස තෝරා ගත යුතුය. විධායක කමිටුව සඳහා පත් කරගත යුතු නිලධාරීන්

a) ගරු සභාපති
b) ගරු නියෝජ්‍ය සභාපති
c) ගරු උප සභාපති (වත්කම් පාලනය)
d) ගරු උප සභාපති (සමාජ සුභ සාධක)
e) ගරු උප සභාපති (ක්‍රීඩා)
f) ගරු උප සභාපති (සංස්කෘතික කටයුතු)
g) ගරු උප සභාපති (මහජන සම්බන්ධතා හා ප්‍රවර්ධන)
h) ගරු උප සභාපති (ශාස්ත්‍රීය හා වෘත්තිමය)
i) ගරු උප සභාපති ( අධ්‍යාපන සහ සිසු ප්‍රවර්ධන)
j) ගරු උප සභාපති ( මාධ්‍ය සහ සන්නිවේදන)
k) ගරු ලේකම්
l) ගරු උප ලේකම්
m) ගරු භාණ්ඩාගාරික
n) ගරු උප භාණ්ඩාගාරික
o) ගරු අභ්‍යන්තර විගණන නිලධාරී
p) ගරු අතිරේක ලේකම්

21 ව්‍යවස්ථාව - විධායක කමිටුව

විධායක කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය

a) සියළුම නිලධාරීන් හා
b) ජපානයේ ක්‍රියාත්මක වන සියළුම සංවිධාන හා ශ්‍රී ලංකාව වෙනුවෙන් ක්‍රියාත්මක වන සංවිධාන වලින් නියෝජිතයන් දෙදෙනකු බැගින් ඔවුන් ට අනුකූල සංවිධාන වල සභාපති ලේකම් විසින් ලිඛිතව නම් කළ යුතුය.

I. ශ්‍රී ලංකා බිස්නස් කවුන්සිලිය
II. ශ්‍රී ලංකා වාහන අපනයන කරුවන්ගේ සංගමය
III. ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමය
IV. ශ්‍රී ලංකා වෘත්තිකයන්ගේ සංගමය
V. ශ්‍රී ලංකා විද්වතුන්ගේ සංගමය

සියළුම විධායක කමිටු සාමාජිකයින්ට ඡන්ද බලය හිමි විය යුතුය.

22 ව්‍යවස්ථාව

විධායක කමිටුව තෝරා පත්කිරීම ඉහත අංක 20 ව්‍යවස්ථාවේ සඳහන් නිලධාරීන් ද ඇතුළු විධායක කමිටු සාමාජිකයින් කලින් තනතුරු දැරූ නිලධාරීන් ට හැර අනෙක් සියළු දෙනාම මහා සභාවක දී තෝරා පත් කර ගත යුතුය.

23 ව්‍යවස්ථාව - නිල කාලය

පහත සඳහන් අය හැර අනෙක් සියළුම විධායක කමිටු නිලධාරීන් ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම වනතුරු සිය නිල තනතුරු දැරිය යුතුය.

මේ අය හැර

a) සංගමයේ සාමාජිකත්වය අහිමිවී ඇති අය,
b) ශාරීරික හෝ මානසික දුබලතා හේතුවෙන් ඔහුගේ/ඇයගේ නම නිලයට පවරා ඇති රාජකාරී හා වගකීම් ඉටු කිරීම නොහැකි තත්වයට පත්වූ අය,
c) විධායක කමිටුව මගින් තමන් ට ලබා දී ඇති සියළුම ලිපි ලේඛන වත්කම් ගරු ලේකම් වෙත එවන ලද ලිපියක් සමගින් භාර දී ඉල්ලා අස්වීමේ ලිපි භාරගෙන ඇති අය,
d) (i) විධායක කමිටු රැස්වීමට පැමිණීමට නොහැකි වන හේතුව ගරු ලේකම් වෙත නොදන්වා පිළිවෙළින් විධායක කමිටු රැස්වීම් තුනකට සහභාගි නොවූ අය,
(ii) සංගමයේ පැවැත්මට සහ යහපතට හානිදායක පැවැත්ම සලකා බැලීමෙන් පසු ඉවත් කොට ඇති අය.

24 ව්‍යවස්ථාව - විධායක කමිටු රැස්වීම

විධායක කමිටු රැස්වීම පහත සඳහන් පරිදි විය යුතුය.

a) වසරකට 04 වතාවක් රැස්වීම පැවැත්විය යුතුය.

b) හදිසි අවශ්‍යතාවයක් පැන නැගුණු විට විශේෂ රැස්වීමක්
විධායක කමිටු රැස්වීමක දී එම රැස්වීම පිළිබඳ ලේකම් විසින් දිනය, වේලාව, ස්ථානය සහ න්‍යාය පත්‍රය පිළිබඳව දැන්වීම නියමිත දිනට අඩු තරමින් දින 05 කට වත් කලින් ඊ-මේල් මගින් දැන්විය යුතුය.

**25 ව්‍යවස්ථාව** - විධායක රැස්වීම් සඳහා

ගරු සභාපති හෝ නියෝජ්‍ය සභාපති හෝ ගරු ලේකම් හෝ උප ලේකම් වරයෙකු පැමිණ සිටිත් නම් විධායක කමිටු රැස්වීමක ගරු තනතුරු ඇති අය 5ක් වත් සිටිය යුතුය.

**26 ව්‍යවස්ථාව** - විධායක කමිටුවේ පුරප්පාඩු පිරවීම

පත්වීමක් කිරීමෙන් පසු විධායක කමිටුවේ පුරප්පාඩුවක් ඇති වුවහොත් ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන තුරු කටයුතු කිරීම සඳහා සාමාජිකයෙකු පත් කිරීමට විධායක කමිටුව ක්‍රියා කළ යුතුය.

**27 ව්‍යවස්ථාව** - විධායක කමිටුවේ සමාන්‍යය බලතල වගකීම

ඉහත ව්‍යවස්ථාවන් අනුව පැවරී ඇති බලතල හා වගකීම් වලට අගතියක් නොවන පරිදි විධායක කමිටුවට පහත සඳහන් බලතල පැවරී ඇත.

a) විශේෂ නිශ්චිත කාර්යයන් සඳහා හෝ විශේෂ වගකීමක් දැරීමට සාමාජිකයෙකු හෝ උප කමිටුවක් පත් කිරීමට.

b) සංගමයේ පරමාර්ථ වලට අනුකූලවන පරිදි ක්‍රියාවට නැංවීම.

c) සංගමයේ පරමාර්ථයක් සපුරා ලීම සඳහා මුදල් එකතු කිරීමට හා මුදල් වියදම් කිරීමට වාර්ෂික ක්‍රියා පිළිවෙල ක්‍රියාවට නැංවීම පිළිබඳ විධායක කමිටුව සාමුහිකව වගකිව යුතු අතර මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට ද බැඳී සිටිය යුතු වේ.

## මුදල් හා ගිණුම්

**28 ව්‍යවස්ථාව** - සංගමයේ මුදල්

සාමාජික ගාස්තු ප්‍රදානයක් හා අනෙක් ආදායම් ආදී සියල්ලම සංගමයේ වත්කම් වන අතර ඒවා විධායක කමිටුවට වගකියන ගරු භාණ්ඩාගාරික භාරයේ තිබිය යුතුය.

කෙසේ වුවත් සංගමයේ විධායක කමිටුව අවශ්‍ය යයි සලකන්නේ නම් සංගමයේ මූල්‍යමය වත්කම් පිළිබඳ කටයුතු කිරීම වෙනත් විධායක කමිටු සාමාජිකයෙකුට පැවරිය හැකිය.

**29 ව්‍යවස්ථාව** - බැංකුවක මුදල් තැන්පත් කිරීම

සංගමයේ මුදල් සියල්ලම විධායක කමිටුව මගින් අනුමත කරන ලද බැංකුවක දිගු පැවැත්මකින් තොරව සංගමයේ නමින් තැන්පත් කළ යුතු අතර එම ගිණුම නිලධාරීන් දෙදෙනෙකු විසින් ක්‍රියාත්මක කළ යුතුය. ඉන් එක් නිලධාරියෙක් ගරු භාණ්ඩාගාරික විය යුතු අතර අනෙක් තැනැත්තා ගරු සභාපති හෝ ලේකම් විය යුතුය.

**30 ව්‍යවස්ථාව** - සුළු වියදම් සඳහා මුදල්

උපරිම ප්‍රමාණය යෙන් 100,000/- හෝ විධායක කමිටුව විසින් අනුමත කරන ලද සාධාරණ මුදලක් තම සන්තකයේ තබා ගැනීමට හෝ භාණ්ඩාගාරිකට හෝ පුළුවන. මෙම මුදල සංගමයේ හදිසි අවස්ථාවක දී ප්‍රයෝජනයට ගන්නා මුලු වියදම් සඳහා විය යුතුය.

**31 ව්‍යවස්ථාව** - ආදායම් හා වියදම් වාර්තා

විධායක කමිටුවට වාර්තා කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී ගරු සභාපති හෝ ලේකම් විසින් පරීක්ෂා කිරීම සඳහා සියලුම ආදායම් හා වියදම් පිළිබඳ යාවත්කාලීන වාර්තා ගරු භාණ්ඩාගාරික විසින් සකස් කොට තබා ගත යුතුය. ඕනෑම අවස්ථාවක දී මෙය පරීක්ෂා කිරීමට හැකි විය යුතුය.

**32 ව්‍යවස්ථාව** - වාර්ෂික අයවැය ලේඛනය

## VII සංගමයේ මුදල් පරිපාලනය

a) ඉදිරි ක්‍රියාකාරී වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාදාමයන් ඇතුලත් කෙටුම්පතක් අය වැය ඇස්තමේන්තුව සමග අලුත් විධායක කමිටුව විසින් සලකා බැලීම සඳහා වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

b) එකී කෙටුම් පතේ ඇතුලත් ක්‍රියා දාමයන් ක්‍රියාවට නැංවීමට විධායක කමිටුව ධෛර්යමත් කළ යුතු අතර එමගින් අවශ්‍ය වන හදිසි අවස්ථාවක මුහුණ දීමට සූදානම් විය යුතුය.

**33 ව්‍යවස්ථාව** - වියදම්

සැලකිය යුතු ප්‍රමාණයකට වඩා වැඩි වන වියදම් සඳහා විධායක කමිටුව තීරණය කළ යුතු අතර එය විධායක කමිටුවේ පූර්ව අනුමැතිය මත කළ යුතුය.

විගණන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීම පිරික්සුවා සනාථ කිරීමේ ලියකියවිලි, සියලුම වියදම් වෙනුවෙන් භාණ්ඩාගාරික භාරයේ තබා ගත යුතුය.

**34 ව්‍යවස්ථාව**

ඉදිරි වර්ෂය සඳහා වූ සංගමයේ ගිණුම් ප්‍රකාශයක් සෑම විධායක කමිටු රැස්වීමකටම ගරු භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කළ යුතුය.

**35 ව්‍යවස්ථාව** - වාර්ෂික ගිණුම් ප්‍රකාශය

සෑම වසරකදී ම ආදායම් සහ වියදම් පිළිබඳව වූ ගිණුම් ප්‍රකාශයක් ගරු භාණ්ඩාගාරික විසින් පිළියෙල කළ යුතු අතර වාර්ෂික මහා සභා රැස්වීමට දින 14 කට පෙර එය විගණනාධිකාරීන්ට ඉදිරිපත් කළ යුතුය. එවිට එය ගිණුම් ප්‍රකාශනය සමග විශේෂ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට ගරු භාණ්ඩාගාරිකට පුළුවන.

**36 ව්‍යවස්ථාව** - වත්කම් අත්පත් කර ගැනීම හා ඉවත් කිරීම

සංගමය වෙනුවෙන් තම අභිමතය පරිදි වෙනත් චංචල හෝ නිශ්චල දේපොළක් අත්පත් කර ගැනීමට ප්‍රයෝජනයට ගැනීමට සංගමය වෙනුවෙන් කටයුතු කිරීමට විධායක කමිටුවට පුළුවන.

## IX සංගමය විසිරුවා හැරීම

**37 ව්‍යවස්ථාව**

ඕනෑම හේතුවක් නිසා හෝ සංගමය විසිරුවා හැරිය යුතු නම් ඒ සඳහා කැඳවිය යුතු මහා සභා රැස්වීමේ දී මුළු සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් තුනක් වත් තීරණයට පක්ෂව ඡන්දය දිය යුතුය.

සංගමය විසිරුවා හැර ඇවර කළ යුතු වේ නම් සියළුම බැරකම් නිම කිරීමෙන් පසු ඉතිරි වන අරමුදල් මහ සභා රැස්වීමක යෝජනාවක් අනුව ශ්‍රී ලංකාවේ මහා භාරකාරතුමා වෙතට දායක කළ යුතු වේ.

## VIII සංගමයේ ව්‍යවස්ථාව

**<u>38 ව්‍යවස්ථාව</u>** - ව්‍යවස්ථාවට සංශෝධන

මහා සභා රැස්වීමක දී පැමිණ සිටි සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකක පිරිසකගේ එකඟත්වයෙන් අලුත් ව්‍යවස්ථාවක් සෑදීමට, මෙයට එකතු කිරීමට වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට සංගමයට බලය තිබේ. එසේ කිරීමට මුළු සාමාජික සංඛ්‍යාවේ භාගයක මූලිකත්වයෙන්ද කල හැකි අතර මෙයින් විශාල වන ප්‍රමාණය ගණන් ගත යුතු අතර ඒ සඳහා එම රැස්වීම පිළිබඳ දින 14 කට වත් කලින් දැන්විය යුතුය. ව්වස්ථා සංශෝධන විශේෂ මහා සභා රැස්වීමකින් අනුමත කරනු ලබන දිනයේ සිට බලාත්මක වනු ඇත.

**<u>39 ව්‍යවස්ථාව</u>** - සංගමයේ ලිපි ගොනු සහ පොත් පත්

විධායක කමිටුවේ නිලධාරීන් විසින් සියළු කල්හිම තමන් පෞද්ගලිකවම හෝ වෙනත් අයෙකුගේ අධීක්ෂණය යටතේ කරන ලද කටයුතු පිළිබඳ පොත් පත් හා ලිපි ලේඛන ඕනෑම අවස්ථාවක පරීක්ෂා කිරීම සඳහා නිසි ලේඛන වල විධිමත් ලියකියවිලි වලින් සූදානම් කොට තැබිය යුතුය. ඒවා ඊළඟට පත්වන විධායක කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා ද සූදානම් කොට තැබිය යුතුය.

**<u>40 ව්‍යවස්ථාව</u>** - සංගමයේ ලිපි ගොනු සහ පොත් පත් පරීක්ෂා කිරීම

ඡන්ද බලය හිමි සෑම සාමාජිකයෙකුටම අඩු තරමින් දින 14 කට කලින් වත් ගරු ලේකම් භාණ්ඩාගාරික වෙත අයදුම් පතක් ඉදිරිපත් කොට සංගමයේ පොත් පත් ලිපි ගොනු ලිපි කටයුතු ආදිය පරීක්ෂා කිරීමට පුළුවන. ඒ සඳහා දිනයක් හා වේලාවක් පිළිබඳ අයදුම් පතේ සඳහන් කල යුතුය. එය අදාල නිලධාරියාගෙන් විමසා සකස් කළ යුතු නිසාය.

**<u>41 ව්‍යවස්ථාව</u>** - බලාත්මක වන දිනය

2017 මැයි මස 27 වන දින අනුමත කරන ලද මේ ව්වස්ථාව 2017 මැයි මස 27 වන එම දිනයේ සිට බලාත්මක වනු ඇත.